



කෞමදි ජයශානි රත්නායක

# කතා කරන ඔරලෝසුව


## කෞමදි ජයශානි රත්නායක

**(කතෘ)**



**ISBN: 1728**



**මහමායා බාලිකා විද්‍යාලය**
**මහනුවර**


**3 – C**

**07.02.2025**

# පිදුම

මට හැමදාම ආදරය කරන මගෙ අම්මටත්
අප්පච්චීටත්, මගේ ඉස්කෝලේ පාන්තිබාර
ගුරුමෑණියන්ට සහ අප පාසලේ ප්‍රධානාචාර්ය
ගුරු මෑණියන් ඇතුළු සියලුම ගුරු මෑණිවරුන්ට
සහ ගුරු පියවරුන්ටත්, මගේ පන්තියේ සියලුම
යහලුවන්ටත්, මගේ පෙරපාසලේ  ප්‍රධානාචාර්ය
ගුරු මෑණියන් අතුලු සියලූම ගුරුමෑණියන්ටත්,
මගේ පෙරපාසලේ සියලූම යහලුවන්ටත් මෙම
කතා කරන ඔරලෝසුව

කතාව බැති සිතින් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්වදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# කතා කරන ඔරලෝසුව

ගුණපාල මාමයි, සිරියාවති නැන්දයි හරිම ආදරණීය යුවලක්. ඉතිං දවසක් දා මෙ දෙන්නා බඩුගන්න නගරයට ගියා.



ඉතිං ඔහොම මේ දෙන්නා බඩුගනිද්දී, එක කඩයකදි සිරියාවති නැන්දා දැක්කා ලස්සනම ලස්සන ඔරලෝසුවක්. ඉතිං මේක දැකලා සිරියාවති නැන්දට ආසාහිතුනා ඔරලෝසුව මිලදීගන්න. එහෙම හිතලා ගුණපාල මාමට කිව්වා මට මේ ඔරලෝසුව ඕනෙමයි කියලා.

ඊට පස්සේ ගුණපාල මාම කඩේ මුදලාලිගෙන් ඇහුව, අර ඔරලෝසුවේ මිල කීයක් වෙනවද කියලා.ඒත් මුදලාලි කිව්වා, මම නම් මේ ඔරලෝසුව විකුණන්නේ නැහැ කියලා.



අනේ ඒත් සිරියාවති නැන්දා කියනදේ ඇහුවෙම නැහැ. මට මේ ඔරලෝසුව ඕනමයි කියලා ඇවිටිලි කරා.

ගුණපාල මාමගේ බලවත් ඉල්ලීම මත, කඩේ මුදලාලි ලොකු මිලකට ඔරලෝසුව මේ දෙදෙනට විකුණුවා.

ඊට පස්සේ ඔරලෝසුවත් අරගෙන මේ දෙන්නා සතුටින් ගෙදර ගියා.

මේ දෙන්නා ගෙදර ඇවිත් ඔරලෝසුව බිත්තියේ එල්ලුවාට පස්සේ මහා පුදුම වැඩක් වුනා.

මේ ඔරලෝසුව නිකම්ම නිකම් ඔරලෝසුවක් නෙමෙයි. මේක කථාකරන ඔරලෝසුවක්.  ගුණපාල මාමටයි, සිරියාවති නැන්දටයි හරිම සතුටුයි.

ඔහොම ටික කාලයක් සතුටින් කාලය ගතවෙද්දී අනේ මොකද වුනේ. ඔරලෝසුවේ බැටරිය බැස්සා.

අනේ දෙදෙනාටම හරිම දුකයි. දෙදෙනාම කඩේ මුදලාලි ගාවට ආයිමත් ගිහින් බැටරි තිබෙනවාදැයි ඇසුවා.  කඩේ මුදලාලි කිව්වා ඒ බැටරි ඉවරවෙලා කියලා.

මේ දෙදෙනා අනෙක් හැම කඩයකම හෙව්වත් බැටරි තිබ්බේ නැහැ.

ඉතිං ගුණපාල මාමටයි සිරියාවතී නැන්දටයි හරිම වැඩේ වුනේ. ලග  තිබුණ සල්ලිත් වියදම් වුනා. ඔරලෝසුවෙන් වැඩක් වුනෙත් නැහැ.

වැඩ කරන්නේ නැති ඔරලෝසුවක් ළඟ තියාගෙන මේ දෙන්නාට දුකසේ කාලය ගත කරන්න සිදුවුනා.

ඉතිං මෙමගින් පුංචි අපිට ගතහැකි ආදර්ශය වන්නේ ,

දකින දකින දේවල්වලට ආසා නොවී අපිට වඩාත් ප්‍රයෝජනවත් දෙයක්ම හොඳින් සොයාබලා ගැනීමට පුරුදුවෙමු.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්